(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 10.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 දෙසැම්බර් 12 වැනි බදාදා අ.භා. 1.00 ට**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

පා. 4/’18

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා,— විශ්වාසය ප්‍රකාශ කිරීමේ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු රනිල් වික්‍රමසිංහ මහතා හට අග්‍රාමාත්‍යවරයා වශයෙන් ක්‍රියාකිරීමට පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති බවට මෙම සභාව යෝජනා සම්මත කරයි.

2.

පා. 3/’18

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරි පියවර ගතයුතු බව,— 2018 ඔක්තෝබර් 26 වැනි දින ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කළ හෙයින් ද;

2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර 2018 නොවැම්බර් 16 වැනි දින ගරු මහින්ද රාජපක්ෂ මහතා සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම යෝජනාව සම්මත වූ හෙයින් ද;

ඒ අනුව 2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර ඇති හෙයින් ද;

2018 නොවැම්බර් 16 වැනි දින සම්මත වූ යෝජනාව හරයාත්මකව ගරු මහින්ද රාජපක්ෂ මහතා සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් වන හෙයින් ද; සහ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති හෙයින් ද;

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ගතයුතු ඉදිරි පියවර ගන්නා ලෙස මෙම පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාට යෝජනාකර සිටියි.